# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1954/35 - 2016 පෙබරවාරි මස 19 වැනි සිකුරාදා - 2016.02.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 3/1992 (III).

**1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත**

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වන වගන්තිය සමඟ කියවිය යුතු 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 64 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලද නියෝග.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2016 පෙබරවාරි මස 03 දින,
කොළඹ දී ය.

නියෝග

1993 නොවැම්බර් මස 26 වන දින අංක 794/23 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදුව, වරින් වර සංශෝධිත පරිදි වූ 1993 අංක 1 දරන පතල් කැනීම් (බලපත්‍ර දීමේ) නියෝගවල 42 වන නියෝගය පහත සඳහන් පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි "ගොඩනැගිලි ද්‍රව්‍ය " යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් :—

"ගොඩනැගිලි ද්‍රව්‍ය " යන්නට වැලි, බොරළු, පස්, කබොක්, ඉදිකිරීම් කර්මාන්තයේ දී භාවිතා වන ඩොලමයිට්, පොතුගල්, කැබලි කළ සහ කුඩු කළ කළුගල් ඇතුලු පාෂාණ සහ ගඩොල් සහ උළු නිෂ්පාදනය සඳහා යොදා ගන්නා මැටි ඇතුළත් වේ ;"

(2) එහි "කාර්මික ඛනිජ " යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් :—

"කාර්මික ඛනිජ " යන්නෙන් ඉල්මනයිට්, සර්කොන්, රූටයිල්, මොනසයිට්, කොරල්, ෂෙල් බෙඩ්, මිනිරන්, බෝල මැටි, පිඟන් සහ සිමෙන්ති මැටි, කෙඔලින්, මයිකා, ෆෙල්ඩ්ස්පාර්, හුණුගල්, ලුණු, ජිප්සම්, සමර, වීදුරුවැලි, තිරුවානා, ගානට්, සිලිමනයිට්, කැල්සයිට්, ඇලනයිට්, ප්ලෝරස්පා, සර්පන්ටිනයිට්, ඇපටයිට්, පොහොර ලෙස යොදා ගන්නා ඩොලමයිට්, මැග්නටයිට්, මැග්නසයිට්, පිට්, වොලස්ටෝනයිට් සහ සකස් කළ පාෂාණ අදහස් වේ ;.

03-143


1A - PG 2849 — 106 (2016/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*